**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය -2022**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහ එහි ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ සහ සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

#### 1.5.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රිය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම කාලානුරූපීව සිදුකරනු ලබන ආයුගණක තක්සේරුව මඟින් ගණනය කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසු දිගින් දිගටම ආයුගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා විශ්රාම වැටුප් වගකීම ගණනය කර තිබුණු අතර එසේ ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීම රු.82,435,153,268 ක් විය. තවද අරමුදල විසින් මෙම බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් වගකීම, ආයුගණක තක්සේරුව මත පදනම්ව ගිණුම්ගත කර ඇත. මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවාගැනීම් සිදුනොකරන අතර, ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක කළහැකි නව යෝජනා ක්‍රමයක් ස්ථාපනය කර ඇත. පැරණි යෝජනා ක්‍රමයේ ගෙවීම් වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුළින් වාර්ෂිකව ගෙවීම් කරනු ලබන අතර, නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආයුගණක තක්සේරුව ලබාගන්නා අවස්ථාවේදී පැරණි යෝජනා ක්‍රමයේද ආයුගණක තක්සේරුව ලබාගැනීම සිදුකරනු ඇත. | විශ්‍රාම වැටුප් වගකීම කාලානුරූපීව සිදුකරනු ලබන ආයුගණක තක්සේරුව මඟින් ගණනය කළ යුතු අතර බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් පවත්වාගෙන යා යුතුය. |

### 1.5.1.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සක්‍රිය දායකයින්ගෙන්, ගිණුම් වර්ෂය සඳහා ලැබිය යුතු දායක මුදලේ වටිනාකම හඳුනාගැනීමට හැකිවන පරිදි විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා බැඳුන දිනය සහ හිමිකම්පාන දිනය ඇතුළත් දායකයින්ගේ නාමලේඛනය වාරික ලැබීම් ඇතුළත් කරමින් සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා දායකයින්ගෙන් ලද ආදායම උපචිත පදනම වෙනුවට මුදල් පදනමට රු.13,420,221 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | දායකයින්ගේ තොරතුරු පරිගණක පද්ධතිය තුළින් ලබාගත හැක. පසු වාරික පරිගණක ගත කිරීමේ ප්‍රමාදයන් නිසා අවලංගු වූ හා අක්‍රිය වූ දායකයින් පද්ධතිය තුළින් ලබාගත නොහැක. එම නිසා පසු වාරික ස්වයංක්‍රීයව පරිගණකගත කිරීම සඳහා වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | දායකයින්ගේ නාම ලේඛන යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු.3,968,000,000 ක මුදලින් රු.3,918,881,123 ක් ගෙවීම් කිරීමෙන් පසු ඉතිරි මුදල වූ රු.49,118,877 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර එය ආපසු ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් වියදම රු.4,053,000,000 ක් වූ අතර, භාණ්ඩාගාරයෙන් ලද රු.3,998,000,000 ක් වූ මුදල් සියල්ල ගෙවා ඇත. ආදායම් ප්‍රකාශය තුළ දැක්වෙන්නේ එම මුළු වියදමෙන් දායකයින් විසින් ලබානොගෙන ආපසු ලැබුණු මුදල් අඩුකළ පසු අගය වේ. මේ අනුව භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂයක් නොමැත. | දායකයින් වෙත නොගෙවූ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම්වලින් හිමිකම් නොපෑ රු.167,470,484 ක් ගොවීන්ට ආපසු ගෙවිය යුතු බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකර යෝජනාක්‍රමයේ ආදායම ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ රු.167,470,484 ක හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් මුදල, විශ්‍රාම වැටුප් වියදමින් අඩුකර පෙන්වා ඇත. දීර්ඝකාලීනව විශ්‍රාම වැටුප් ලබා නොගන්නා දායකයින්ගේ විශ්‍රාම වැටුප් අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ. එම නිසා මෙම හිමිකම් නොපෑ මුදල ලැබිය යුතු විශ්‍රාම වැටුපක් ලෙස ගිණුම්ගත කර නොමැත. | ලබා නොගත් විශ්‍රාම වැටුප් ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | 2019 ජනවාරි සිට 2022 දෙසැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.4,435,400 ක හිමිකම් නොපාන ලද ශුද්ධ වාරික මුදල් සහ මාසික බෙලහීන ගෙවීම් සඳහා වූ චෙක්පත් 612 ක් මු.රෙ.396(ඈ)(iii) ප්‍රකාර ගෙවීමට ඇති ණයක් වශයෙන් සටහන් නොකර, ඒ ඒ වර්ෂවලදී ආදායමට ගෙන තිබුණි. | කාලය ඉකුත්වන චෙක්පත් ලේඛනගත කර ආදායමට ගැනීම සිදු කරනු ලබන අතර, ලැබෙන ඉල්ලීම් අනුව නැවත චෙක්පත් නිකුත් කරනු ලබයි. | හිමිකම් නොපාන විශ්‍රාම වැටුප් ගෙවිය යුතු ණය ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.190,000,000 ක් ගොවි | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් ලබාදීම සඳහා ලැයිස්තුගත කර ඇති | භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් යෝජනා ක්‍රමයේ |

| | | | |
|---|---|---|---|
| | විශ්‍රාම වැටුප් අරමුදලෙහි බැංකු ගිණුමට බැර නොකර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමට බැර කර එයින් වියදම් දරා, ජංගම ගිණුමක් මගින් එම ගනුදෙනු අරමුදලෙහි ලෙජරයට සටහන් කර තිබුණි. | ගිණුම වනුයේ ලංකා බැංකුවේ යූනියන් පෙදෙස ශාඛාවේ මණ්ඩලය සතු 164667 දරන ගිණුමය. එම ගිණුමට ලැබෙන අදාළ මුදල් ජංගම ගිණුම හරහා කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයේ සිට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරු කරනු ලැබේ. | බැංකු ගිණුමට ගෙන්වාගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ දී මෙම යෝජනා ක්‍රමයට අදාළව නීතිමය ගනුදෙනු නොතිබියදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නීති වියදමින් සියයට 60 කට සමාන රු.1,348,623 ක් මෙම යෝජනා ක්‍රමයේ නීති වියදම ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම ප්‍රතිශතය තීරණය කළ පදනම හෙළිදරව් කර නොතිබුණි. | මණ්ඩලයේ නීති වියදමින් සියයට 60 ක ප්‍රතිශතයක් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගිණුම්ගත කර ඇත. නමුත් විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි නීති වියදම නැවත සමාලෝචනය කර මෙම යෝජනා ක්‍රමයේ නීති වියදම් පමණක් සටහන් කිරීමට කටයුතු කරනු ලබන අතර, වියදම් බෙදීමට අදාළ කරගන්නා වියදම් ගිණුම් සියල්ල සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | යෝජනාක්‍රමයට අදාළ නීති වියදම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය යන ගිණුම් ඒකක තුනම එක්ව ක්‍රියාත්මකව තිබුණත්, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පරිපාලන වියදමින් සියයට 50 ක් සහ අනෙකුත් වියදම්වලින් සියයට 20 සිට සියයට 50 ක් දක්වා වූ ඉහළ ප්‍රතිශතයන් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කර තිබුණි. එම අනුපාතවල සාධාරණත්වය පරීක්ෂා කිරීම සඳහා අනුපාත තීරණය කළ පදනම හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලයේ සිටින සේවක මණ්ඩලය පොදුවේ සේවයේ යෙදෙන බැවින් මෙසේ අනුපාතය නිර්ණය කර ඇත. නමුත් ඉදිරියේදී මෙම අනුපාතයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගනිමින් සමාලෝචනය කිරීමට කටයුතු කෙරේ. | වියදම අන්තර්ග්‍රහණ අනුපාතය හෙළිදරව් කළ යුතුය. |

**1.5.1.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.1,516,033,327 ක් සහ මුළු වගකීම් රු.87,508,723,633 ක් වූ අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.85,992,690,306 ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, යෝජනා ක්‍රමය තුළ ආයෝජන නොමැතිකමත් මෙම යෝජනා ක්‍රමයේ වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති නිසා ප්‍රතිලාභ වැඩිකිරීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇති අතර, සෑම වර්ෂයකදීම රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරගෙන යනු ලබයි. | යෝජනා ක්‍රමය සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.1.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැපැල් දෙපාර්තමේන්තුවේ දිසා ගිණුම් කාර්යාලවලින් ආපසු ගෙන්වා ගැනීමට ඇති හිමිකම් නොපෑ රු.47,102,835 ක විශ්‍රාම වැටුප් මුදලෙහි නිවැරදිතාවය පරීක්ෂා කිරීමට හැකි අයුරින් මණ්ඩලය විසින් පොත්පත් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය තැපැල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සිදු කරනු ලබයි. නොගෙවූ විශ්‍රාම වැටුප අදාළ මාසයට පසු මාසයේ 10 වන දිනට ප්‍රථම මණ්ඩලය වෙත එවීමට කටයුතු කළ යුතුය. කොරෝනා වසංගත තත්ත්වය හා අර්බුදකාරී තත්ත්වය මත යම් ප්‍රමාදයන් සිදු වුවද මේ වනවිට එම ප්‍රමාදයන් මඟහරවා ගැනිමට කටයුතු කර ඇත. නියමිත දින වකවානු තුළ නොගෙවූ විශ්‍රාම වැටුප් ලේඛන මණ්ඩලය වෙත එවන ලෙස දිසාගණකාධිකාරීවරුන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | හිමිකම් නොපෑ මුදල් පිළිබඳ තොරතුරු සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

### 1.5.2 ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මූල්‍ය ප්‍රකාශන

### 1.5.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලී බඩු සහ සවි කිරීම්, කාර්යාල උපකරණ සහ පරිගණක වැනි රු.696,175 ක් වටිනා සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් තවදුරටත් භාවිතා කරමින් පැවතිය ද ඒවා නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව කටයුතු කර නොතිබුණි. | ලී බඩු හා සවි කිරීම්, පරිගණක උපාංග හා කාර්යාල උපකරණ ආදිය භාවිතා කළද ඒවා අගය කර එළදායී ජීවිත කාලය තක්සේරු කළ නොහැක. බොහොමයක් වත්කම් ඉවත් කළ යුතු තත්ත්වයේ පවතින අතර පරිගණක වැනි උපකරණ යාවත්කාලීන කළ හැකි තත්ත්වයේ නොපවතියි. මෙම වත්කම් පූර්ණ කාර්යක්ෂමතාවයෙන් භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින බැවින් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | භාවිතා කරමින් තිබෙන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් නැවත තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව මෙම යෝජනාක්‍රමයේ සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එම ආයු ගණක තක්සේරුව සිදු කර නොතිබුණු අතර එදිනට සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම රු.5,068,050,746 ක් විය. | ආයුගණක තක්සේරුව 2023 වර්ෂයේ සිදුකිරීමට කටයුතු කරනු ලබන අතර, එය අයවැය ලේඛනය තුළ ඇතුළත්වේ. | විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව අනුව කාලානුරූපීව ගණනය කළ යුතුය. |

#### 1.5.2.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ධීවර විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කාර්ය මණ්ඩලයක් නොමැතිව තිබියදී මණ්ඩලයේ සභාපතිගේ පෞද්ගලික ලේකම්, තඹුත්තේගම දිස්ත්‍රික් කාර්යාලයේ කාර්යාල සහායක සහ මන්නාරම දිස්ත්‍රික් කාර්යාලයේ කළමනාකරණ සහකාර නිලධාරියෙකු සේවයේ යොදවාගෙන ඒ තිදෙනාට වැටුප් ලෙස එකතුව වූ රු.2,209,812 ක් ගෙවා යෝජනාක්‍රමයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම නිලධාරීන් බඳවාගෙන ඇත්තේ මෙම යෝජනාක්‍රමයේ රාජකාරී සඳහා වේ. වර්තමානයේ වෙනත් රාජකාරි කටයුතු කරනු ලබන අතර වෙනත් නිලධාරීන්ද මෙම යෝජනාක්‍රමයේ රාජකාරි සිදු කරයි. මෙම නිලධාරීන්ගේ වැටුප යෝජනාක්‍රමයට ඇතුළත් කර ඇත. ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් පසු යෝජනාක්‍රමයට අදාළ සේවකයින්ගේ වැටුප් යෝජනාක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීමට නියමිතය. | අනුමත නොවූ තනතුරු සඳහා බඳවා ගැනීම සහ වැටුප් ගෙවීම නොකළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයෙන් ඉදිරියට රැගෙන එන ලද රු.98,000 ක ධීවර මරණ පාරිතෝෂික අරමුදලෙහි ගෙවිය යුතු ශේෂය 2020 වර්ෂයේ නිරවුල් කර ඇතත් එම නිරවුල් කිරීම සදොස් ලෙස ගිණුම්ගත කිරීම නිසා ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද ඉදිරියට රැගෙන විත් තිබුණි. | මෙම මුදල මරණ පාරිතෝෂික අරමුලින් හා ධීවර විශ්‍රාම වැටුප් අරමුදල් තුළින් ගැලපීම් සිදුකොට 2023 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදිව දැක්වීමට කටයුතු කරනු ලැබේ. | සිදුව ඇති වරද වහාම නිවැරදි කළ යුතුය. |

#### 1.5.2.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.663,412,060 ක් සහ මුළු වගකීම් රු.5,140,628,886 ක් පැවති අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.4,477,216,826 ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | මෙම යෝජනාක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන අතර, වාරික තීරණය කිරීමේදී රාජ්‍ය සහනාධාරයට අන්තර්ග්‍රහණය කිරීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත. ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වගකීම ඉහළ යනු ලබන අතර එම නිසා ශුද්ධ වත්කම් අගයද අඩු වේ. එම හේතු නිසා මෙම යෝජනාක්‍රමය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රවර්ධනය නොකරයි. | යෝජනා ක්‍රමය සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන
#### 1.5.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතිමුත් තවදුරටත් භාවිතා කරමින් පවතින රු.33,415,830 ක පිරිවැය වූ දේපළ පිරියත උපකරණවල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ | ඓතිහාසික පිරිවැය මත ගිණුම් තබා ඇති සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති සමහර වත්කම් භාවිතා කළද පූර්ණ වශයෙන් භාවිතා කළ නොහැකි වත්කම් පවතී. එම වත්කම් ඉදිරියේදී ඉවත් | ඵලදායී ජීවිත කාලය සමාලෝචන ය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමිති 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | කිරීමට කටයුතු කරනු ඇත. | යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 හි 7 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ප්‍රදාන සාධාරණ තහවුරුවක් ලැබෙනතුරු ආදායම් ලෙස හඳුනා නොගත යුතු වුවත්, භාණ්ඩාගාරයෙන් තහවුරුවක් නොමැතිව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව ඇස්තමේන්තු කර වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කර ඇති නොමිලේ රක්ෂණය යටතේ ආවරණය වන වගා බිම් අක්කර ගණන පදනම්ව ගණනය කර, අක්කර එකකට රු.675 ක වාරිකයක් බැගින් 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වාරික ආදායම, රු.4,249,619,152 ක් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල උපචිත කර තිබුණි. එම වටිනාකම සමුච්චිත අරමුදලින් සියයට 62 ක් වන අතර එම සම්පූර්ණ මුදලම මණ්ඩලයට ලැබීම අවිනිශ්චිත බව නිරීක්ෂණය කෙරේ. | 2018 අයවැයෙන් බෝග වර්ග 6 ක් සඳහා රු.40,000 ක උපරිම වන්දියක් ලබාදීමටත් අනිවාර්ය බෝග වගා රක්ෂණය සඳහා අක්කරයකට රු. 675 බැගින් 2018 වර්ෂයේදී රුපියල් මිලියන 2,200 ක් වෙන්කර ඇති අතර, මෙම යෝජනා ක්‍රමය සඳහා වාර මුදල් ගිණුම්ගත කරනුයේ ඉහත අයවැය යෝජනාවට හා අනුමත කැබිනට් මණ්ඩල පත්‍රිකාවට අනුව වන අතර, 2022 වන විට මණ්ඩලයට ලැබිය යුතු වාර මුදල් ලෙස රුපියල් මිලියන 4.249 ක මුදලක් පවතී. | සාධාරණ තහවුරුවක් ලැබෙනතුරු රාජ්‍ය ප්‍රදාන අදායම් ලෙස හඳුනා නොගත යුතුය. |

**1.5.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයට අයත් මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන නගරවල පිහිටි නිල නිවාස 3 පිහිටි පර්චස් 76.6 ක් වූ ඉඩම් තුන තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගැනීම සඳහා දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂකවරුන් සමග සාකච්ඡා කර අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, කඩිනමින් කටයුතු අවසන් කර තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතුය. |
| (ආ) | මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයෙහි පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලබාදුන් රාජ්‍ය ප්‍රදාන රු.1,500,000 ක් භාණ්ඩාගාරයෙන් ලද මුදල් ලෙස නොපෙන්වා සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල සදොස් ලෙස වෙනත් ආදායම් ලෙස දක්වා තිබුණි. | ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා ධීවර දෙපාර්තමේන්තුව මගින් ලැබෙන රු.1,500,000 ක මුදල සෘජුව මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් නොලැබෙන නිසා වෙනත් ආදායම් තුළ පෙන්වා ඇත. | රාජ්‍ය ප්‍රදාන, භාණ්ඩාගාරයෙන් ලද මුදල් ලෙස පෙන්විය යුතුය. |
| (ඇ) | ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සමඟ ඒකාබද්ධව කෘෂි රක්ෂණ යෝජනාක්‍රමවල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සහ එමඟින් ශ්‍රී ලංකාවේ කෘෂි රක්ෂණ ආවරණය ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් 2016 මැයි 05 වන දින සහයෝගිතා ගිවිසුම්ගතව, වගාහානි සඳහා රක්ෂණ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය මාස 2½ ක් දක්වා අඩුකර ගැනීම සඳහා දර්ශක මත පදනම් වූ | කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතිය කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් සිදුකරනු ලබන අතර, අදාළ වියදම් කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ප්‍රතිපූර්ණය කරනු ලබයි. ඊට අදාළ සියලුම ගනුදෙනු | තොරතුරු පද්ධතිය මූල්‍ය ප්‍රකාශන තුළ වත්කමක් ලෙස හඳුනාගත යුතුය. අපේක්ෂිත පරමාර්ථ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දී ගොඩනගාගෙන ඇති කෘෂිකාර්මික කළමනාකරණ තොරතුරු පද්ධතියට, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.20,391,089 ක මූල්‍ය පහසුකම්, මණ්ඩලය වෙත ලබාදී තිබුණු අතර වර්ෂය අවසාන වන විට මණ්ඩලය විසින් ඒ සඳහා රු.23,009,698 ක් වැයකර තිබුණු නමුත් මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. වන්දි ගණනය කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු පද්ධතිය භාවිතා නොකරන නිසා ව්‍යාපෘතියේ අපේක්ෂිත පරමාර්ථ අත්කර ගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කර ඇති අතර, ගිණුම් සටහන් මගින්ද අනාවරණය කර ඇත.<br>2020, 2021 වර්ෂවල කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් වගා හානි වාර්තා වීම්, හානි අධීක්ෂණ කටයුතු ආදිය ප්‍රමාද සහිතව සිදුවීම නිසා දර්ශක ප්‍රතිඵල ක්ෂේත්‍ර අධීක්ෂණ ප්‍රතිඵල සමග සන්සන්දනය කිරීමට නොහැකිවූ බැවින් ද කාලගුණික දත්ත ලබාගැනීමේදී සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන්, එම ගණනය කිරීම් අනුව වන්දි ගෙවීම් සිදුකර නොමැත. | |
| (ඈ) | වගා රක්ෂණ යෝජනාක්‍රමය යටතේ රක්ෂණ ආවරණය ලබාගෙන තිබුණු ගොවීන් 18 දෙනෙකු වෙත, මණ්ඩලයේ අරමුදල්වලින් වන්දි ගෙවීම වෙනුවට ජාතික රක්ෂණ භාර අරමුදලින් සහ භාණ්ඩාගාරයෙන් මුදල් ගෙන්වාගෙන, 2021 යල කන්නය සඳහා රු.336,150 ක වන්දි මුදල් ගෙවා තිබුණි. | වන්දි ලේඛන පරිගණකගත කිරීමේ දී ඇතිවූ දෝෂයක් හේතුවෙන් වගාවේ හානියට හේතුව වැරදි ලෙස පරිගණක ගත වී ඇත. මේ සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලින් ලබාගෙන ඇති මුදල් ඉදිරියේදී ලැබීමට ඇති මුදල් වලින් අඩුකර ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාල වෙත නැවත උපදෙස් පත්‍රිකා යැවීමට කටයුතු කරනු ලැබේ. | රක්ෂණ ආවරණය ලබාගෙන තිබුණු ගොවීන් වෙත මණ්ඩලයේ අරමුදල්වලින් වන්දි ගෙවීම කළ යුතුය. |
| (ඉ) | මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල විසින් රක්ෂිතයින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා එකතු කළ රු3,284,147. ක් වූ වාරික මුදල් දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබිය යුතු රක්ෂණ වාරික ලෙස සදොස්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මෙම මුදල දෙසැම්බර් මස දිස්ත්‍රික් පරිපාලන ගිණුම තුළ ඇතුළත් වුවත්, ප්‍රධාන කාර්යාලයේ අදාළ යෝජනා ක්‍රමයන්හි ගිණුම්වලට මුදල් ප්‍රේෂණය වන්නේ ඊළඟ ගිණුම් වර්ෂයේ මුල් මාසය තුළදී වන නිසා ලැබිය යුතු වාරමුදල් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇත. | දිස්ත්‍රික් කාර්යාල සහ මණ්ඩලය එකම ගිණුම් ඒකකයක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඊ) | පෞද්ගලික විදුලි සංදේශන සමාගමකින් 2021 ඔක්තෝබර් මාසයේදී පරිත්‍යාග ලෙස ලද ටැබ් යන්ත්‍ර 10 ක් ඉන්වෙන්ට්‍රිගත කර හෝ මූල්‍ය නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | අදාළ ටැබ් යන්ත්‍ර තොග ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත. | පරිත්‍යාග ඉන්වෙන්ට්‍රිගත කර මූල්‍ය නොවන වත්කම් වලට ඇතුළත් කළ යුතුය. |
| (උ) | ණය සහ විවිධ කාර්යයන් සඳහා නිලධාරීන් වෙත ලබාදුන් අවුරුදු 02 සිට අවුරුදු 38 ක් දක්වා පැරණි රු.1,107,227 ක් වූ අත්තිකාරම් ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින මෙම ශේෂයන්, මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල | ණය හා අත්තිකාරම් අයකරගැනීමට ඇති හැකියාව පරීක්ෂා කර අයකර ගැනීමට |

| | | |
|---|---|---|
| නොතිබුණි. මෙම ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය වුවද ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | පත්‍රිකා ඉදිරිපත් කර එම ශේෂයන් මෙම ගිණුම් වර්ෂය තුළදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කටයුතු කළ යුතුය. අවිනිශ්චිත අත්තිකාරම් සඳහා ප්‍රතිපාදන ඇති කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ සේවය සඳහා මුදාහරින ලද නිලධාරියෙකුට 2011, 2012 හා 2013 වර්ෂ සඳහා මණ්ඩලයෙන් ගෙවන ලද වැටුප් මුදලින් ප්‍රතිපූර්ණය කර නොගත් රු.171,011 ක් වූ මුදල වර්ෂ 10 ක සිට මූලා ප්‍රකාශනවල ඉදිරියට ගෙනඑමින් පවතී. | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින මෙම ශේෂය, ඉවත් කිරීමට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර, එම ශේෂයන් මෙම ගිණුම් වර්ෂය තුළදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | නොපමාව ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළයුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.426,871 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | මෙම ශේෂය දීර්ඝ කාලීනව පවතින ශේෂයක් බැවිනුත්, අදාළ පාර්ශවයන් මෙම මුදල් නැවත ඉල්ලුම් නොකිරීම නිසාත්, එම මුදල් ආදායමට ගැනීමට කටයුතු කර ඇත. | නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩල කළමනාකරණ සේවා ගණයෙහි තනතුරු සඳහා වූ බඳවාගැනීමේ පරිපාටියේ 4.3.1(අ) උප වගන්තිය | (i). රක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක රක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතු වුවත්, එයට පටහැනිව වසර 03 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. | 2021 වර්ෂයේ ලබාදුන් සහකාර අධ්‍යක්ෂ පත්වීම් බඳවාගැනීම් පරිපාටියට පරිබාහිරව සිදුකර නොමැත. බඳවා ගන්නා ලද නිලධාරීන් ආයතනයේ අවශ්‍යතාවය පරිදි අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත. | රක්ෂණ කටයුතු පිළිබඳ වසර 03ක පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | (ii). සැලසුම් අංශයේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය අංශයේ/ සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ආයතනයක වසර 03 ක සැලසුම්කරණ හෝ කාර්යඵල මෙහෙයුම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතු වුවත්, එයට පටහැනිව වසර 03 ක ක්ෂේත්‍ර හා පරිපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. | 2021 වර්ෂයේ ලබාදුන් සහකාර අධ්‍යක්ෂ පත්වීම් බඳවාගැනීම් පරිපාටියට පරිබාහිරව සිදුකර නොමැත. බඳවා ගන්නා ලද නිලධාරීන් ආයතනයේ අවශ්‍යතාවය පරිදි අනුයුක්ත කිරීමට කටයුතු කර ඇත. | සැලසුම්කරණ හෝ කාර්යඵල මෙහෙයුම් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති නිලධාරියෙකු බඳවාගත යුතුය. |
| (ආ) | 2015 මැයි 25 දිනැති PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 2 ඡේදය | චක්‍රලේඛයේ ප්‍රතිපාදන නොමැතිව තිබියදී MM 1-1 සේවා ගණයට අයත් නිලධාරීන් 19 දෙනෙකු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුළදී රු.1,380,533 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. | අනුමැතිය ලබා ගැනීම සඳහා 2019/05/10 දිනැති අංක 3/1/8/1 දරන ලිපිය මගින් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලුම් කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙන තෙක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ක්‍රියාත්මක වන අතර, 2023/03/27 දිනැති අංක 3/1/8/1 දරන ලිපිය මගින් නැවත රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කර ඇත. | චක්‍රලේඛයෙන් ආවරණය නොවන ගෙවීම් නොකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනතේ 7(අ) උප වගන්තිය | කෘෂිකාර්මිකයන්ට ස්ථාවරත්වය ලබාදීමේ හා කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ පරමාර්ථය ඇතිව, පාඩු වෙනුවෙන් ඔවුන්ට හානි පූර්ණය සැලසීම සඳහා කෘෂිකාර්මිකයින්ගේ ප්‍රතිලාභය පිණිස මණ්ඩලය විසින් පවත්වාගෙන ගිය කෙතට අරුණ රක්ෂණ ක්‍රමයට අදාළ ගොවීන් 8,185 කට 2017 සහ 2018 වර්ෂවල දී ගෙවන ලද රු.70,800,200 ක වන්දි මුදල්, ගිණුම් අංක, ගොවීන්ගේ නම් හා හැඳුනුම්පත් අංක නොගැලපීම හේතුවෙන් වාණිජ බැංකු මඟින් ආපසු එවා ඇතත් අදාළ ගොවීන් හඳුනාගෙන එම ශේෂය නිරවුල් කිරීමට වසර 5 ක් තිස්සේ කටයුතු කර නොතිබුණි. | ගෙවීම් ප්‍රතික්ෂේපිත වූ ගොවීන් සඳහා සංශෝධිත ලේඛන සකස් කර එවන ලෙස ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇති අතර, එසේ ලැබුණු සංශෝධිත ලේඛන සඳහා ගෙවීම් කර ඇත. වන්දි මුදල් නැවත හිමිකම් නොපෑ ගොවීන්ගේ එකී රු. 70,800,200/- ක මුදල දිගින් දිගටම ගොවීන් විසින් හිමිකම් නොපෑම නිසා කෘෂි රක්ෂණ අරමුදල වෙත මාරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර, එම මුදල් කෘෂිකාර්මික දත්ත කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීම සඳහා ලබාදීමට අනුමැතිය හිමි වී ඇත. නමුත්, එම මුදල් එකී අරමුණ සඳහා භාවිතා නොකළ බැවින් නැවත අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | ගොවීන් හඳුනාගැනීමට නිශ්චිත වැඩ පිළිවෙලක් හඳුන්වාදී ඒ අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,440,680,754 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,575,875,061 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.864,805,693 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ රු.937,877,186 කින් වන්දි ගෙවීම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021/22 මහ කන්නය සඳහා ගොවීන් 26,904 දෙනෙකුට ගෙවීමට නියමිත වන්දි මුදලින් රු.10,777,000 ක හදිසි අනතුරු රක්ෂණ වාරිකයක් අඩු කරගෙන තිබුණු අතර එම මුදල අඩු කර ගත් දිනයේ සිට වසරක කාලයකට හදිසි අනතුරු රක්ෂණ ආවරණයක් ලබා දියයුතු වුවත් ගොවීන් 14,779 දෙනෙකුට රක්ෂණ වාරික | 2020/2021 මහ කන්නයේ සිට වන්දි ගෙවීමේදී 2017 චක්‍රලේඛයේ සඳහන් හදිසි අනතුරු රක්ෂණ ඔප්පුව නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් උපදෙස් ලද බැවින් මේ වන විට රක්ෂණ ඔප්පු ලබාදීමට කටයුතු කර ඇත. | හදිසි අනතුරු රක්ෂණ ආවරණය සඳහා බඳවාගත් අවස්ථාවේදීම රක්ෂණ සහතික ලබාදීමට කටයුතු කළ යුතුය. |

මුදලක් අඩු කර ගත් දිනයේ සිට මාස 7 ක් ගත වී තිබුණද රක්ෂණ සහතික ලබා දී නොතිබුණි.

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේදී සංවර්ධන නිලධාරී තනතුර සඳහා නිලධාරීන් 15දෙනෙකු බඳවාගෙන තිබුණු අතර එම බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා ගත් අනුපිළිවෙල මත සකස් කළ නාමලේඛනයෙහි 3, 5, 7සහ 12යන ස්ථානවල නම් ඇති, අයදුම්කරුවන් 4දෙනෙකු බඳවා නොගෙන ඊට වඩා අඩු ලකුණු ලබා තිබුණු අයදුම්කරුවන් 4දෙනෙකු බඳවාගෙන තිබුණි. | සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් සේවයට කැඳවීම සඳහා කටයුතු කරන ලද අතර, එම අයදුම්කරුවන් සේවයට වාර්තා නොකිරීම පිළිබඳ මණ්ඩලයට කරුණු දැක්විය නොහැකිය. | සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා ගත් අනුපිළිවෙල මත අයදුම්කරුවන් බඳවාගත යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇඹිලිපිටිය දිස්ත්‍රික් කාර්යාල පරිශ්‍රය හා නිල නිවාසය 1998 වර්ෂයේ සිට අබලන් තත්ත්වයේ සහ අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින බව මණ්ඩලය හඳුනාගෙන තිබුණු නමුත් අලුත්වැඩියා කර නොමැති බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | වසර ගණනාවක් පැරණි නිසා අලුත්වැඩියාව සඳහා විශාල මුදලක් වැයවේ. වර්තමානයේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සීමා පනවා ඇති නිසා මෙම තත්ත්වය උදාවී ඇත. මෙම ඉඩම සඳහා තක්සේරු වාර්තාවක් ලබාගැනීමට ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවා ඇති නමුත්, තාක්ෂණික නිලධාරීන්ගේ සීමිත බව නිසා තක්සේරු වාර්තාව ලැබී නොමැත. | කාර්යාලය සහ නිල නිවස අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. |